**අපගේ මැදිහත් වීමේ යැදුම් අපි ක්‍රිස්තුන් වහන්සේ මගින් දෙවි පියාණන් වහන්සේ වෙත ඔසවමු.**

1. ධර්මය පදනම් වූ රටක් - රාජ්‍යයක් උදෙසා අපි යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම:**

ලොව ප්‍රධානතම ආගම් 4 ශ්‍රී ලංකා ද්වීපයේ තිබුනද රටේ පාලනය තුළ අපි දකිනුයේ පටු දේශපාලන මතිමතාන්තරය. අප පාර්ලිමේන්තුව දෙස බලත්දී මෙය මැනවින් දැක ගත හැකිය. බොහෝ දෙනාගේ දෙවියෝ පක්ෂ දේශපාලනයයි; මත වාදයයි. බොහෝ විට ආගමික නායකයින් පවා ධර්මයේ හරය එලියට ගනිමින් දේශය ධර්මානුකූල වූ ගමනකට රැගෙන යනවා වෙනුවට ඊට එරෙහි මාර්ගයන්හී රැගෙන යනු පෙනේ.

**අපි යාච්ඤා කරමු.**

ආගම් 4 ම නායකයින් හට ධර්මානුකූල වූ මාවතක් කරා දේශය ගෙන යාමට අවශ්‍ය දේව වරප්‍රසාද ලැබෙනු සඳහාද, භක්තියෙන් හා ගෞරවයෙන් යුක්තව, සාමකාමී තැන්පත් ජීවිතයක් රටේ ජනතාවට ගත කළ හැකි වන පිණිස, රටේ නායකයන් හා උසස් තනතුරු දරන සියල්ලන් උදෙසා ද යාච්ඤා කරමු.

2. සරල අල්පේච්ඡ ජීවිතය හා දරිද්‍රතාවයෙන් පෙළෙන්නා රැක ගැනීමේ ධාර්මික පදනම අප දේශය තුළ දියත් කිරීමට ආගම් 4 ම නායකයන් එකමුතු කරගෙන දේශය තුළ දියත් කිරීමේ බලය කිතුදන පුබුදුව වෙත ලැබෙනු සඳහා අපි යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම:**

ආගම් 4 එනම් බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි පොදු ප්‍රබල ධර්මයක් නම් සරල අල්පේච්ඡ ජීවිත ක්‍රමයයි. මෙය කිතු දන පුබුදුවේ ජීවමාන සම්ප්‍රදායයි. කටු මැටි වලින් තැනූ, පොල් අතු වලින් සෙවිලි කළ කුඩා පැල්පතක ජීවත් වන අපගේ නිර්මාතෘ තුමා දයාබර ස්වාමි තාත්තා තම ජීවිතය තුලින් අප හට මෙය මනාව පැහැදිලි කර දී ඇත. අපගේ ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ ජීවිතාදර්ශයද කදිම නිදසුනකි. අපගේ දේශයේ විනාශයට ප්‍රධානතම හේතුවක් සේ සැලකිය හැක්කේ මෙම ධර්මය පිළිබඳව ඇති අනවබෝධයයි. අප සමාජය පොහොසතා පොහොසත් කරවන, දිළින්දා වඩාත් දිළින්දෙක් කරවන ආර්ථිකයක් කරා වේගයෙන් ගමන් කරයි. මෙයින් තණ්හාව, ඉරිසියාව, වෛරය, ක්‍රෝධය සමාජය තුළ ලැව් ගින්නක් සේ ඇවිළෙයි.

**අපි යාච්ඤා කරමු.**

මෙම පාපිෂ්ඨ, අන්ධකාර ජීවිත ක්‍රමයෙන් අප දේශය මුදා ආගම් ශාස්තෘවරුන් 4 දෙනාම ජනතාව වෙත පෙන්වූ දයාවේ ජයග්‍රාහී මාවත වන අල්පේච්ඡ ජීවිත ක්‍රමයක් වෙත අප රටේ ආගමික නායකයින්, පාලකයින් ඇතුළු ජනතාව රැගෙන යනු සඳහා අපි යාච්ඤා කරමු.

3. අප දේශයේ දරිද්‍රතාවනේ පෙළෙන්නන උදෙසා යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම:**

අල්පේච්ඡතාවය යනු ස්වකීය නිදහස් කැමැත්තෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් වෙනුවෙන් අත්හැරීමයි. දිළින්දෙක් වීමයි. අති පොහොසත් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප සියලු දෙනා උදෙසා දිළින්දෙක් වූ සේක. "දරිද්‍රතාවය" යනු පාපයේ විපාකයක් ලෙස බලහත්කාරයෙන්ම දරිද්‍රතාවය අත්දැකීමට සිදුවීමයි. එසේ නම් ආගම් 4 ධර්මය අනුව අප දරිද්‍රතාවයෙන් පෙලෙන්නන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය. අප සරල උදාහරණයක් දෙස සිත් යොමු කරමු. වෛද්‍යවරුන්ගේ වැඩවර්ජනය. මෙයින් සිදු වනුයේ කුමක්ද? දරිද්‍රතාවයෙන් පෙළන්නා තවත් දරිද්‍රතාවය කරා ඇද දැමීමයි. මොහොතකට මේ නිසා දුක් පීඩා විඳින ජනතාව සිහිපත් කරමු. ඔවුන්ගේ ගැලවීමට අප ජීවිත කැප කිරීමට අධිෂ්ඨාන කරමු.

**අපි යාච්ඤා කරමු.**

දෙවි පියාණෙනි, අප දේශය තුළ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව බොහෝය. ඔවුන් සියල්ලන් උදෙසා අපි ඔබ වහන්සේ ඉදිරියෙහි මැදිහත් වෙමු. අප රට පාලකයන් ඇතුළු ජනතාව දරිද්‍රතාවයට තව තවත් හෙලන බලවතුන් උදෙසා අපි යාච්ඤා කරමු. එමෙන්ම පියාණෙනි, පුබුදු ජනතාවක් ලෙස ඔවුන්ගේ හඬට සවන් දීමටත්, ඔවුන්ගේ ජන ජීවිතය නගාලීමටත් ගත හැකි සෑම පියවරක්ම නිර්භයව තැබීමට අවශ්‍ය වරප්‍රසාද සහ බලය ඉල්ලා යාච්ඤා කරමු.

4. ඩෙංගු වසංගතය උදෙසා යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම**:
ඩෙංගු රෝගය අද වසංගතයක් බවට පත්වී ඇති. රජය ජනතාව වෙත ඇඟිල්ල දිගු කරන අතර ජනතාව රජය වෙත ඇඟිල්ල දිගු කරයි. එහෙත් අප කළ යුත්තේ කුමක්ද? විශ්ෂයෙන් පුබුදු ජනතාවක් ලෙස අප එකිනෙකා ගත හැකි සෑම පියවරක්ම ගත යුතුයි. පුබුදු සංඝයක් ලෙසත්, ඉන් ඔබ්බටද ගමන් කරමින් අනිකුත් ආගමික නායකයන් හා ජනතාවද ඒකරාශී කරමින් ගත හැකි සැම පියවරක්ම ගත යුතුය. ඒ අතරම රජය අවදි කිරීමේ දූත කාර්යයද අප සතුව ඇත.

**අපි යාච්ඤා කරමු.**
දයාබර දෙව් පියාණෙනි, ඩෙංගු වසංගතය අප දේශයෙන් සදහටම තුරන් කරන ලෙස අපි ඔබ වහන්සේට යාච්ඤා කරමු. කන්නලව් කරමු. අප දේශය තුළ ජීවිත අහිමි වූ දහස් සංඛ්‍යාත ජනතාව අතර, කුඩා දරුවන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, වැඩිහිටියන්, ගර්භනී මව්වරුන් අප සිහිපත් කරනුයේ හද කම්පාවෙන්ය. තම ආදරවන්තයන් මදුරුවෙක් නිසා අහිමි වී කඳුළු සලන්නන් උදෙසා අපි යාච්ඤා කරමු. මේ මහා වසංගතයෙන් අප දේශය ගළවා ගන්නා ලෙස අපි යාච්ඤා කරමු.

5. අප දේශයේ කුණු කඳු කඩා වැටීමෙන් ජීවිත අහිමි වූවන් උදෙසා අපි යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම**:
දෙවිඳාණෝ අප හට තෑගි කළේ අලංකාර වූ දේශයකි. එහි ඇති කඳු වැටි, ගලන්නාවූ ගංගාවන්, කළු, කැළණි, වළවේ, මහවැලි කොයි තරම් අලංකාරද? දිය ඇලි, වන සිවුපාවුන්, අලි ඇත්තු, ස්වභාවික වන ගැබ්, මුතු මැණික් යනාදියෙන් කොයි තරම් අලංකාර වූ ද යත්, "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" යන විරුදාවලිය අපට ලැබුණි. එහෙත් අද ලොව අප ගැන කතා කරනුයේ කුණු කන්දල් ගැනද? අපගේ දේශය අවලක්ෂණ කළේත්, ජන ජීවිතය විනාශ කළේත් කව්රුන්ද? අපගේ හෘදසාක්ෂිය අප හොඳින් පරික්ෂා කළහොත් ඒ අපම බව අපට වැටහී යනු ඇත.

**අපි යාච්ඤා කරමු.**
දෙව් පියාණෙනි, අපගේ පාපයට අපි සමාව අයැද සිටිමු. "මනස්ථාපනයේ" හදවතක් අප සැමට තෑගි කළ මැනව. අප දේශයේ පාලකයන් වෙනුවෙන්ද ජනතාව වෙනුවෙන්ද අපි යාච්ඤා කරමු. මෙම වැරදි මාර්ගය නිවැරදි කර ගැනීමේ ප්‍රඥාව විශේෂයෙන් අප දේශයේ පාලකයන් හට දානය කළ මැනව.

6. අප දේශයේ පිලිකාවක් සේ උඩු දුවන "සයිටම්" ප්‍රශ්නය වෙනුවෙන් අපි යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම**:
අද මෙය විෂම, ව්‍යාකූල වූ ප්‍රශ්නයක් බවට පත්වී ඇත. මන්ද යත් දේශපාලන බලධාරීන්, පසුගිය රජය, වර්තමාන රජය, ධනවතුන්, බලකාමී වෛද්‍යවරුන් ඊට සම්බන්ධය. තව කොටසක් අසරණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොමඟ යවන ආකාරයක් පෙනේ. එක් ශිෂ්‍ය කණ්ඩායමකගේ වර්ජනය සැබවින්ම අනාගත වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වීමට බලාපොරොත්තුවෙන් සිටින ශිෂ්‍ය කණ්ඩායමකට දොරවල් වසයි. සෑම පැත්තකින්ම ඇසෙන්නේ අසහනකාරී තත්ත්වයකි. වෛද්‍යවරු වැඩ වර්ජනය කරති. දරිද්‍රතාවයෙන් පෙලෙන්නා තවත් දරිද්‍රතාවයට ඇද දමති. සියල්ල ව්‍යාකූලය. පාපය, ආත්මාර්ථය, මතවාද රජ කරති. අපට පිහිට විය හැක්කේ කාටද?

**අපි යාච්ඤා කරමු.**
දෙවිඳුනි මෙම ව්‍යාකූල ප්‍රශ්නය අද දින අපි ඔබ වහන්සේ වෙතට රැගෙන එමු. අප රට පාලකයන් හට නිර්භයව නිවැරදි ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය කරන ස්වර්ගීය බලය ඔවුනට ලැබෙනු සඳහා අපි යාච්ඤා කරමු.

7. පිළිකා රෝගය ලොවින් තුරන් කිරීම සඳහා අපි යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම**:
මෙම වචනය දෙවිඳුන්ගෙන් අප හට ලැබූ දිව්‍යසිවර වචනයක් සේ අපි විශ්වාස කරමු. ලබන වසරේ ශුද්ධාත්ම මංගල්‍යය වෙත්දී අප දේශයේ මහරගම පිළිකා රෝහලේ බොහෝ ඇඳන් හිස් වන බව අපගේ ඒකාන්ත විශ්වාසයයි.

**අපි යාච්ඤා කරමු.**
දෙව් පියාණෙනි, දයානුකම්පාවෙන් පිරුණු දෙවියනි, මනුෂ්‍යයාගේ දුකට, වේදනාවට මෙතරම්ම සමීප ඔබ වහන්සේ පිළිකා රෝගයෙන් පෙළෙන්නන්ට සැනසීම ලබා දීම ඔබ වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත බව අපට හෙළිදරව් කළ සේක. අපගේ විශ්වාසය වැඩි වර්ධනය කළ මැනව. ඔබ වහන්සේ අපට දුන් වචනය එලෙසම සිදුවන බව අපි විශ්වාස කරමු. පොරොන්දු ඉෂ්ඨ කරන දෙවිඳුනි, අපි ඔබ වහන්සේට ස්තූති ප්‍රශංසා කරමු.

8. අපි ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ "වේ ප්‍රශංසා මා සමිඳුන්ට" විශ්ව චක්‍ර ලේඛණය මුල් කරගෙන යාච්ඤා කරමු.

**මෙනෙහි කිරීම** :
මෙම විශ්ව චක්‍ර ලේඛණය තුළින් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් ලෝ වැසි සියල්ලන් හට ආරාධනා කරනුයේ මුළු පොළෝ තලය තමන්ගේ පොදු නිවහන කරගන්නා ලෙසය. මෙම හඬට අප සවන් දුන්නොත් අපගේ දේශය තුළ සිදුවන මිනී මැරුම්, ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, වංචාව සහ සොරකම සොබා දහම වැනසීම යනාදි සියල්ලම අහෝසි වී දේශය තුළ ධර්මයේ සුවඳ හමන්නට පටන් ගනු නියතය. එම දූත කාර්ය පැවරී ඇත්තේ අපගේ දෑතටය.

**අපි යාච්ඤා කරමු.**
දයාබර දෙව් පියාණෙනි, මෙම විශ්ව චක්‍ර ලේඛණය තුළින් එළිදරව් වූ ආලෝකය බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ කතෝලික ජනතාව වෙත අතී මහත්වූ උනන්දුවෙන් රැගෙන යාමේ බලය අප හට අද දින දානය කළ මැනව.

9. අපි ස්වාමි තාත්තා වෙනුවෙන්ද, දිව්‍යසි එකතුව, සහයක එකතුව, උපදේශක මණ්ඩලය වෙනුවෙන්ද, සාංඝික නායකත්වය, සංඝ නායකත්වය ඇතුළු පුබුදුව තුළ නායකත්වයක් ගන්නාවූ සැම කෙනෙක් වෙනුවෙන්ද යාච්ඤා කරමු. එලෙසම මුළු මහත් පුබුදු ජනතාව වෙනුවෙන්ද යාච්ඤා කරමු. 2021 වසරේ අප සැමරීමට සූදානම්ව සිටින අපගේ රන් ජුබිලය වෙනුවෙන්ද යාච්ඤා කරමු.